(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 42.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 ඔක්තෝබර් මස 20 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0269/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1990 සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ එක් එක් වර්ෂයේදී කොළඹ වරාය විසින් මෙහෙයවන ලද;

(i) බහාළු ප්‍රමාණය කොපමණද;

(ii) සාමාන්‍ය නැව් බඩු හෝ බහාළුගත නොකළ නැව් බඩු ටොන් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දකුණු ආසියා පිවිසුම් මාර්ග ගිවිසුම අත්සන් කළ දිනය සහ එහි මෙහෙයුම් ආරම්භ වූ දිනය කවරේද;

(ii) ගිවිසුමේ ප්‍රධාන කොන්දේසි කවරේද;

(iii) අදාළ පාර්ශ්වයන් මෙම කොන්දේසි ඉටු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දකුණු ආසියා පිවිසුම් මාර්ග මෙහෙයුම්වලට පෙර සහ ඊට පසු අද දක්වා වූ පසුගිය වර්ෂ 15 තුළ එළිසබෙත් රැජිණ තටාකයේ බහාළු සහ සාමාන්‍ය නැව් බඩු මෙහෙයවීමේ කාර්ය සාධනය කවරේද;

(ii) එළිසබෙත් රැජිණ තටාකය ලැබූ ආදායම සහ පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේ ලැබූ ශුද්ධ ලාභය කොපමණද;

(iii) දකුණු ආසියා පිවිසුම් මාර්ගය සඳහා ලබාදුන් බදු සහන කවරේද;

(iv) බදු විරාමය ලබා දීමෙන් සිදුවූ ආවස්ථික අලාභය කොපමණද;

(v) එසේ කිරීමෙන් ලැබූ ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

0373/'10

2.

ගරු නූර්දීන් මෂූර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 1990 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට උතුරු පළාතේ යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන පරිපාලන දිස්ත්‍රික්කවල මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහ වකුෆ් අංශයේ ලියාපදිංචි වී තිබූ,

(i) මුස්ලිම් පල්ලි, ජුම්ආ පල්ලි, තක්කියා, සාවියා සහ ධර්ගා යන මුස්ලිම් ආගමික පුණ්‍යායතනවල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම්, ලිපිනයන් සහ ලියාපදිංචි අංක කවරේද;

(iii) මුස්ලිම් පල්ලි සහ පුණ්‍යායතනවල නීත්‍යානුකූල භාරකරුවන් වශයෙන්, ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයෙන් හෝ මුස්ලිම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් එවකට පත්කරනු ලැබ සිටි තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් මුස්ලිම් පල්ලි සහ පුණ්‍යායතනවලට අයත් යැයි කියනු ලබන (1956 අංක 51 දරන මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත යටතේ ලියාපදිංචි කොට ඇති) නිශ්චල දේපල හා ඉඩකඩම් කවරේද;

(v) ඉහත එක් එක් වකුෆ් දේපල පිහිටි ස්ථානයේ වරිපනම් අංක සහ ලිපිනයන් කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0397/'10

3.

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ 2009 වර්ෂයේදී වාර්තාගත වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එය ඉන් පෙර වර්ෂය හා සැසඳීමේදී රෝගීන් සංඛ්‍යාවේ වැඩිවීමක් ද; නැතහොත් අඩුවීමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජරට ප්‍රදේශයේ ව්‍යාප්ත වකුගඩු රෝගය සඳහා හේතු වූ සාධක හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) අදාළ හේතු සාධක ප්‍රදේශයෙන් ඉවත් කිරීම සඳහා යෝජිත හෝ ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0405/'10

4.

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්පකුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වූ මුළු ඒඩ්ස් රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එයින්, මෙතෙක් මියගිය රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රුධිර පාරවිලයනය මගින් ඒඩ්ස් රෝගයට ගොදුරු වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) මත්ද්‍රව්‍ය එන්නත් කිරීම මගින් ඒඩ්ස් රෝගයට ගොදුරු වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝගී මවගෙන් රෝගය වැලඳුනු දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් 2007, 2008 හා 2009 වර්ෂවල ඒඩ්ස් රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා දරන ලද මුළු වියදම මුදලින් කොපමණද;

(ii) ඒඩ්ස් රෝග ව්‍යාප්තිය මර්ධනය සඳහා දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0414/'10

5.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර, මැද දුම්බර පිහිටි හෙයාර්ෆාක්වත්තේ හෙක්ටයාර් 976.75ක භූමි භාගය කැළණිය, වනවාසල පුනස්ටා ග්‍රීන් ගාඩන්ස් සමාගමේ අධ්‍යක්ෂ මංජුල ගුණවර්ධන යන අය වෙත රු. මිලියන 2ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?;

(ආ) (i) අදාළ ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු බදු ගිවිසුමට අනුව කටයුතු කර තිබේ ද;

(iii) එසේ නොමැති නම්, ඊට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) බදුකරු නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, අදාළ බදු ගිවිසුම අවලංගු කර ඉඩම නැවත රජයට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(v) එසේ නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳ වග කිවයුත්තෝ කවුරුන්ද;

(vi) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0468/'10

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී.ටී.ඊ. ජාත්‍යන්තර අංශයේ නායකයා ලෙස හඳුන්වනු ලැබූ කුමරන් පද්මනාදන් නැමැති අය අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට රැගෙන ආ දිනය කවරේද;

(ii) ඔහුට විරුද්ධව චෝදනා ගොනුකොට තිබේද;

(iii) එසේ නම්, ඒ කුමන අධිකරණයකද;

(iv) ඔහු දැනට රඳවාගෙන සිටින්නේ බන්ධනාගාරයකද; නැතහොත් වෙනත් ස්ථානයකද;

(v) බන්ධනාගාරයක නම් එහි නම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඔහු පසුගිය දිනක වන්නි ප්‍රදේශයේ සංචාරයකට රැගෙන ගොස් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0605/'10

7\.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය නායයෑම් පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ට අයත් විමර්ශන කටයුතු සඳහා වැය කර ඇති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංවිධානය නායයෑම් පිළිබඳව රාජ්‍ය අංශයේ විමර්ශන කටයුතු සඳහා මූල්‍යමය අය කිරීමක් සිදු කරන්නේද;

(iii) 2009 වර්ෂයේ නායයෑම් පිළිබඳව පෞද්ගලික අංශයේ විමර්ශන කටයුතු සිදු කිරීම මගින් එම සංවිධානය ඉපැයූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නායයෑම්වලින් සිදුවන හානිය අවම කිරීම සඳහා ආපදා කලාප පිළිබඳව දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0606/'10

8\.

ගරු හේමාල් ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ මෙරට කුරුඳු වගා කරන ලද හෙක්ටයාර සංඛ්‍යාව කොපමණද;

(ii) 2007, 2008 සහ 2009 වර්ෂවලදී අපනයනය කරන ලද කුරුඳු මෙට්‍රික්ටොන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් වර්ෂයේ කුරුඳු අපනයනයෙන් ඉපැයූ ආදායම කොපමණද;

(iv) 2009 වර්ෂයේ දේශීය කුරුඳු අපනයනය ලෝක වෙළඳපොළේ කුරුඳු ඉල්ලුමෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙරට කුරුඳු නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිති සහතික ලබාගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු කුරුඳු නිෂ්පාදනය සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0415/'10

9\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ, වොක්ෂෝල් වීදියේ, අංක 175 ඒ කොටසෙහි වර්ග අඩි 5,000 ක ගබඩාව, කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 139 හි පිහිටි සමර්විල් කම්පැනි නම් වූ සමාගමට මාසික කුළිය රු. 67,500 ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු විසින් බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නොකරන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0446/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අමාත්‍යාංශ වෙත පැවරී ඇති බලතල, රාජකාරී සහ කාර්යයන් පිළිබඳ ගැසට් පත්‍රය 2010 අප්‍රේල් 30 දින ප්‍රකාශයට පත් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම බලතල, රාජකාරී සහ කාර්යයන් ඉන්පසුව වෙනස් කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එසේ නම්,

(i) බලතල, රාජකාරී සහ කාර්යයන් අඩු කරනු ලැබූ අමාත්‍යාංශ කවරේද;

(ii) එම බලතල පවරන ලද්දේ කා හටද;

(iii) එම වෙනස්කම් සිදුකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මේ වන විට අමාත්‍යාංශ සතු සියලු බලතල, රාජකාරී සහ කාර්යයන් සඳහන් සම්පූර්ණ ලැයිස්තුවක් එතුමා ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0469/'10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී.ටී.ඊ. ජාත්‍යන්තර අංශයේ නායකයා ලෙස හඳුන්වනු ලබන කුමරන් පද්මනාදන් නැමැති අය විසින් පාලනය කරන ලද එල්.ටී.ටී.ඊ.යට අයත් ජාත්‍යන්තර වත්කම් රජය විසින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් ප්‍රමාණය කොපමණද;

(iii) එම වත්කම්වලින් දැනට ශ්‍රී ලංකා රජය විසින් රාජසන්තක කොට තිබෙන වත්කම් මොනවාද;

(iv) එසේ රාජසන්තක නොකොට තිබෙන වත්කම් මොනවාද;

(v) එම වත්කම් තිබෙන බවට දැනට සොයාගෙන තිබෙන රටවල් මොනවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0609/'10

12.

ගරු මොහාන් ප්‍රියදර්ශණ ද සිල්වා මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 හා 2009 වර්ෂවලදී දේශීය වෛද්‍ය අවශ්‍යතාවය අනුව මෙරටට ආනයනය කරන ලද ඖෂධ පැළෑටි වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ පැළෑටි ආනයනය සඳහා ඉහත වර්ෂවලදී දැරූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඖෂධ පැළෑටි මෙරට වගා කිරීම සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, අදාළ ව්‍යාපෘති සඳහා මේවන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0416/'10

13.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ,

(i) ඇති කුඩා තේ වතු බිම් ප්‍රමාණය කොපමණද;

(ii) සිටින කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) නියඟය නිසා විනාශ වූ කුඩා තේ වතු බිම් ප්‍රමාණය කොපමණද;

(iv) නියඟය නිසා පීඩා විඳින කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මේ වන විට නියඟයෙන් හානි වූ තේ වතු නඟා සිටුවීමට කටයුතු සම්පාදනය කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියා මාර්ග කවරේද;

(iii) නියඟයෙන් කුඩා තේ වතු හිමියන්ට වූ හානිය අවම කිරීමට නැවත වගාව සඳහා සහනාධාර ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0456/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ නගරය තුළ තිබූ පදික වෙළෙඳුන් සතු සියලුම වෙළෙඳසැල් කඩා දැමීමේ වැඩ පිළිවෙළක් රජය ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒවා ඉවත් කරන ලද දිනය සහ ඒවා ඉවත් කළේ කුමන හේතුවක් නිසාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සියලුම වෙළෙඳසැල් මේ වන විට සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒවා ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) තවමත් වෙළෙඳසැල් පවත්වාගෙන යන පදික වෙළෙඳුන් සිටින්නේ නම් එම වෙළඳාම නීත්‍යානුකූල කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉවත් කරන ලද පදික වෙළෙඳුන් සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ට විකල්ප ස්ථාන ලබා දී තිබේද;

(iii) ඔවුන්ගේ නම් සහ ඔවුන්ට ලබාදී ඇති විකල්ප ස්ථාන කවරේද;

(iv) කොළඹ නගරය හැර වෙනත් ප්‍රදේශවලත් මෙම ගැටලුව පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) දේශපාලන පළිගැනීමක් සඳහා මෙය සිදුකළ බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0470/'10

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී.ටී.ඊ. ය සමග කළ අවසන් සටනේදී රජයේ හමුදාවන් විසින් එල්.ටී.ටී.ඊ.ය සතුව තිබී අත්අඩංගුවට රත්තරන් කිලෝ ප්‍රමාණය කොපමණද?

(ii) එම රත්තරන් තොගය සොයාගත් හමුදා නිලධාරීන් කවුරුන්ද;

(iii) එම රත්තරන් තොගය බාරදී ඇති උසාවිය හෝ ස්ථානය කුමක්ද;

(iv) එම රත්තරන් තොගයේ වටිනාකම රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— භාණ්ඩාගාර ලේකම් (නියෝජිතයන් පත්කිරීමේ),— යම් නීති ප්‍රඥප්තියක් මගින් පිහිටුවන ලද යම් කමිටුවක, අධිකාරියක, මණ්ඩලයක හෝ ආයතනයක සාමාජිකයකු ලෙස භාණ්ඩාගාර ලේකම්වරයා පත්කිරීමට එකී නීති ප්‍රඥප්තිය මගින් විධිවිධාන සළසා ඇති අවස්ථාවක මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ යම් දෙපාර්තමේන්තුවකින් පුද්ගලයන් නම් කිරීමට ද ඊට සම්බන්ධ හෝ ඊට ආනුශංගික කාරණා සඳහා විධිවිධාන සැළැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන),— කාලය අනුව තීරණය කරනු ලබන ආකාරයකට ගෙවීම් පැහැර හැර ඇති බදු අයකර ගැනීම පිණිස ක්‍රමවත් සහ කඩිනම් ක්‍රියාවලියක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; යම් අවස්ථාවන්හි දී පැහැර හැර ඇති බදු කපා හැරීම සඳහා ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුලු (විශේෂ විධිවිධාන),— නව සුලු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන තැනැත්තන්ට ඔවුන්ගේ සුලු ව්‍යාපාරයක් පිහිටුවීමට හැකිවීම සඳහා ප්‍රදේශ නම් කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ),— 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත පරිච්ඡින්න කිරීම සඳහා ද, 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත පරිච්ඡින්න කිරීමට ආනුෂංගිකව විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන),— 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන),— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

### යෝජනා පිළිබඳ දැනුම්දීම

7.

ගරු තේනුක විදානගමගේ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ඔලගංගල මහා සුදර්ශන පරෝපාකාරී පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව, 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| අග්‍ර විනිශ්චයකාරවරයා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් | |
| හා අභියාචනාධිකරණයේ සභාපතිවරයා | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| අග්‍ර විනිශ්චයකාරවරයා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් හා අභියාචනාධිකරණයේ සභාපතිවරයා | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයාට සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අග්‍ර විනිශ්චයකාරවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ ආඥාව,— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1) වැනි වගන්තිය යටතේ ඉඩම්, ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 1981 අප්‍රේල් මස 16 දිනැති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද ආඥාව අනුමත කළ යුතු ය.

*6.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 1),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1) වැනි වගන්තිය යටතේ මහවැලි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2000 මැයි මස 04 දිනැති අංක 1130/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*7.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 2),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2007 මාර්තු මස 06 දිනැති, අංක 1487/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*8.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 3),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2007 මාර්තු මස 09 දිනැති, අංක 1487/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

# 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*14.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*15.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*16.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**